# මුදල් මණ්ඩලය
# ශ්‍රී ලංකා මහ බැංකුව

**2020 නොවැම්බර් 09 චක්‍රලේඛය 2020 අංක 11**

## කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා ණය සහන කාලයක් ලබාදීම

කොවිඩ්-19 ව්‍යසනයේ දෙවන ව්‍යාප්තිය නිසා ව්‍යාපාර හා පුද්ගලයින් විසින් මුහුණපා ඇති ගැටළු සලකා බලමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් ඉදිරියට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) විසින් කොවිඩ්-19 ව්‍යසනය නිසා බලපෑමට ලක්වූ ව්‍යාපාර හා පුද්ගලයන්හට ලබා දී ඇති ණය සහන යෝජනා ක්‍රමය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) 2020 ඔක්තෝබර් 01 දින සිට පහතින් සඳහන් කර ඇති පරිදි තවත් මාස හයක කාලයකට දීර්ඝ කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන වෙත දන්වා සිටී.

මේ අනුව, සියලුම බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ඉහත යෝජනාක්‍රමය ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කරවීම තහවුරු කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත. එසේ වුවද ගනුදෙනුකරුට ලැබෙන සමස්ත ප්‍රතිලාභය මෙම චක්‍රලේඛය මඟින් පිරිනැමෙන සහනයන්ට වඩා අඩු නොවන සේ යම්කිසි බැංකු නොවන මූල්‍ය ආයතනයකට ගනුදෙනුකරුවන් වෙත අමතර ණය සහන ලබාදීමට හැකියාව ඇත.

### 1. ණය සහන කාල සීමාව සහ එය බලපැවැත්වෙන අයුරු

(අ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් හට ඔවුන් විසින් මුහුණපා ඇති මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් 2020 ඔක්තෝම්බර් මස 01 දින සිට ඇරඹෙන පරිදි මාස හයකට නොවැඩි කාලයක් හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාල සීමාවක් සඳහා ණය සහන කාල සීමාවක් බැංකු නොවන මූල්‍ය ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ වෙනත් බලය පවරා ඇති අධිකාරියක් විසින් ලබා දී ඇති අභ්‍යන්තර මාර්ගෝපදේශ වලට අනුකූලව ලබා දිය යුතුය.

(ආ) දුෂ්කරතා වලට මුහුණපා ඇති ගනුදෙනුකරුවන් විසින් කර ඇති ඉල්ලීම අනුව මුල් ණය මුදල සහ පොලිය යන කොටස් දෙක සඳහාම ණය සහනය පිරිනැමිය යුතුය.

### 2. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය

සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් විසින් 2020 නොවැම්බර් 25 දින හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍යයෙන් ඉල්ලුම් කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් දුෂ්කරතා

වලට මුහුණපා ඇති ගනුදෙනුකරුවන් හට ණය සහනය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට සහ ලබා දෙනු ලබන සහන, අයදුම් කළ යුතු අවසාන දිනය සහ අයදුම් කළ යුතු ආකාරය ආදී තොරතුරු ඇතුලත් සරල ආකෘතියක් විද්‍යුත් (විද්‍යුත් තැපැල් සහ කෙටි පණිවිඩ සේවා ඇතුලත්ව) සහ/හෝ මුද්‍රිත මාධ්‍යයෙන් ලබා දීමට කටයුතු කළ යුතුය.

## 3. සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන්

(අ) සංචාරක, ඇඟලුම්, තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වැවිලි, සහ සම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන් (logistic suppliers) අපනයන ක්ෂේත්‍රයේ ඍජු හා වක්‍ර ව්‍යාපාර ඇතුළු කොවිඩ්-19 නිසා වැඩ කටයුතු අඩාල වූ සහ දේශීය සහ විදේශයන්හි පොදු පහසුකම් හා සේවා කටයුතු වසා දැමීම් (lockdowns) නිසා අගතියට පත් ව්‍යාපාර, ව්‍යාපාර හිමිකරුවන් සහ පුද්ගලයන්.

(ආ) නිෂ්පාදන, මූල්‍ය නොවන සේවා, කෘෂිකාර්මික (සැකසුම් කර්මාන්තය ඇතුළුව), ඉදිකිරීම්, අගය එකතු කිරීම් හා අවසර ලත් දේශීය ඖෂධ සැපයුම්කරුවන් ඇතුළු වෙළඳ ව්‍යාපාර වල නියුතු සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පුද්ගලයන් (සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර යන්න මෙහිදී රුපියල් බිලියන 1 ට අඩු පිරිවැටුම් සහිත ව්‍යාපාර වේ).

(ඇ) කොවිඩ්-19 ව්‍යසනය නිසා තම රැකියා හෝ ආදායම් අහිමි වූ ස්වයං රැකියා ව්‍යාපාර සහ පුද්ගලයන් .

## 4. සුදුසුකම් ලබන ණය පහසුකම්

(අ) 2020 මාර්තු 31 දින වන විට හෝ ඊට පසු දිනකදී සක්‍රීය කාණ්ඩයේ පැවති කාලීන ණය, කල්බදු මූල්‍යකරණ පහසුකම්, උකස්, අයිරා වැනි ණය පහසුකම්, වෙළඳ මූල්‍යන හෝ වෙනත් ණය පහසුකම්.

(ආ) ණය කාඩ්පත් පහසුකම් ලබා ගෙන ඇති සහන ලැබීමට සුදුසුකම්ලත් ගනුදෙනුකරුවන් විසින් ඉල්ලීම් කරන්නේ නම්, ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන සුදුසු ව්‍යාපාර තීරණ ගත යුතුය.

**5. ණය සහන කාලයේ සැකැස්ම**

(අ) 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාලසීමාවක් සඳහා ණය සහන කාල සීමාව තුල අයවීමට නියමිත මුල් ණය මුදල සහ පොලිය කාලීන ණයකට පරිවර්තනය කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

(ආ) ණය ගනුදෙනුකරු විසින් කාලීනව පොලිය ගෙවිය යුතු අයිරා පහසුකම් වලට සමාන ණය පහසුකම් සඳහා, 2020 ඔක්තෝම්බර් 01 සිට 2021 මාර්තු 31 හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාලසීමාවක් සඳහා අයවීමට ඇති පොලිය කාලීන ණයකට පරිවර්තනය කළ යුතුය.

(ඇ) උකස් පහසුකම් වල ගෙවිය යුතු දිනය සහන කාල සීමාව තුල යෙදී ඇත්නම් එම පහසුකම් සඳහා ගෙවිය යුතු දිනය 2021 අප්‍රේල් 01 දින දක්වා දීර්ඝ කළ යුතුය.

(ඈ) මෙලෙස පරිවර්තනය කරන ලද ණය සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 අප්‍රේල් 01 දිනට ආසන්නතම දිනකදී පවත්වන දින-364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ පොළී අනුපාතයට සියයට 5.5 ක් එකතු කල වාර්ෂික පොලියට නොවැඩි පොලී අනුපාතයක් අය කල හැකි අතර එම වාර්ෂික පොලී අනුපාතය සියයට 11.5 ක අගය නොඉක්මවිය යුතුය.

(ඉ) මෙම ණය ආපසු අය කරගැනීමේ අවම කාලය වසර දෙකක් වන අතර එම ණය අය කර ගැනීම 2021 අප්‍රේල් 01 දින සිට ආරම්භ කළ යුතුය. කෙසේ වෙතත්, ගනුදෙනුකරු විසින් ඉහත කාලීන ණයකට හරවන ලද මුදල වසර දෙකකට වඩා අඩු කාලයකින් ගෙවා දැමීමට අදහස් කරන්නේ නම් හෝ බැංකු නොවන මූල්‍ය ආයතන විසින් අවුරුදු දෙකකට වඩා වැඩි කාල සීමාවක් ණය ගෙවීම සඳහා ලබා දීමට අපේක්ෂා කරන්නේ නම්, බැංකු නොවන මූල්‍ය ආයතනයන්ට එම ඉල්ලීම් සඳහා පහසුකම් සැලසිය හැකිය. මෙලෙස, ආපසු ගෙවීමේ කාලය වසර දෙකට වඩා වෙනස් වන විට ඒ සඳහා සුදුසු පොළී අනුපාතයක් ගනුදෙනුකරු හා බැංකු නොවන මූල්‍ය ආයතනය විසින් ගිවිසගත යුතුවේ.

(ඊ) 2020 ඔක්තෝබර් 01 දින වන විට ණය සඳහා, එකතු වී ඇති සහ නොපියවා ඇති දඩ පොළී බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කපා හැරිය යුතුය. තවද, ණය සහන කාල සීමාව තුලදී දඩ පොළී එකතුකිරීම හෝ අය කිරීම නොකල යුතුවේ.

(උ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන අනුමත කිරීමට ප්‍රථම ඒවායේ සැකැස්ම පිළිබඳව සුදුසුකම්ලත් ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

**6. ණය සහන සඳහා ගිණුම්කරණය**

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන කාලසීමාවට අදාලව ගිණුම් තැබීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ කොවිඩ්-19 ව්‍යසනය සම්බන්ධව මූල්‍ය වාර්තාකරණයේදී සැලකිය යුතු දෑ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් යම් මාර්ගෝපදේශ සපයන්නේ නම් ඒවා හා අනුගතව කටයුතු කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන හට මේ සම්බන්ධව අමතර මගපෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් විමසිය හැක.

**7. වාර්තාකරණ අවශ්‍යතා**

2020 දෙසැම්බර් 15 දින සිට සෑම මසකම 15 සහ 30 වැනිදා වන විට තම ආයතනයෙන් ණය සහන ලබාගෙන ඇති ගනුදෙනුකරුවන් පිලිබඳ තොරතුරු අදාළ දිනයේ සිට වැඩකරන දින 5 ක් තුලදී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. තොරතුරු ඉදිරිපත් කලයුතු ආකෘතිය ඉදිරියේදී යොමු කරනු ලැබේ.

**මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්**
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති